# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,243 - 2021 අගෝස්තු 27 වැනි සිකුරාදා - 2021.08.27**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : I වැනි ඡෙදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 1206 |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |
| රජයේ නිවේදන ... ... ... | 1206 |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 1208 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් *භාරගැනීම ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2021 සැප්තැම්බර් මස 17 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2021 සැප්තැම්බර් මස 03 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

2021 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

*මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*


1205 – B 82263 — 402 (2021/08)

## අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය

2021 අංක 674

**පත්වීම**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 55 (2) ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව අමාත්‍ය මණ්ඩලය විසින් එස්. ඒ. දිල්රුක්ෂි මහත්මිය 2021 ජූලි මස 05 දින සිට ක්‍රියාත්මක වන පරිදි, නීති කෙටුම්පත් සම්පාදක තනතුරට පත්කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

අමාත්‍ය මණ්ඩලයේ නියමය පරිදි,

ඩබ්ලිව්. එම්. ඩී. ජේ. ප්‍රනාන්දු,
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්.

2021 අගෝස්තු මස 06 වැනි දින දී ය.

08 - 434

---

## රජයේ නිවේදන

### ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - කොටපොල

වන්දනා ගමන් ආඥාපනත (175) වැනි අධිකාරය - ගැටබරු රජමහා විහාරස්ථානයේ වාර්ෂික ඇසළ උත්සවය - 2021

මාතර දිස්ත්‍රික්කයේ, කොටපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඓතිහාසික ගැටබරුව රජමහා විහාරස්ථානයේ ඇසල උත්සවය 2021 ඔක්තෝබර් මස 17 සිට 21 දක්වා පවත්වනු ලබන බව (175 අධිකාරය වූ) වන්දනා ගමන් ආඥපනත යටතේ 1988 මාර්තු 31 වන දින නිකුත් කරන ලද අංක 500 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* I වැනි කොටස : I වැනි ඡේදයේ (සාමාන්‍ය) ප්‍රසිද්ධ කරන ලද රෙගුලාසි යටතේ මෙයින් දන්වමි.

ගනේෂ අමරසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
කොටපොල.

2021 අගෝස්තු මස 06 වැනි දින,
කොටපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

08- 354

---

### ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

වන්දනා ගමන් ආඥාපනත

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, මාදම්පාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සීනිගම ග්‍රාම නිලධාරී වසමේ සීනිගම ශ්‍රී දෙවොල් මහා දේවාලයේ වාර්ෂික ඇසල උත්සවය මෙවර 2021 සැප්තැම්බර් මස 11 වන දින සිට සැප්තැම්බර් මස 13 වන දින දක්වා චාරිත්‍රානුකූලව වතාවත් ඉටු කිරීම සඳහා පමණක් පවත්වනු ලබන බව වන්දනා ගමන් ආඥපනතේ 2 වැනි වගන්තිය අනුව (175 වන අධිකාරය වූ) රෙගුලාසි ප්‍රකාරව අංක 1965/39 හා 2016.05.06 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රය* යටතේ සාදනු ලබන නියෝග අනුව මෙයින් දන්වමි.

ශාන්ත වීරසිංහ,
දිස්ත්‍රික් ලේකම්/දිසාපති.
ගාල්ල පරිපාලන දිස්ත්‍රික්කය.

2021 අගෝස්තු මස 05 වැනි දින,
ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දී ය.

08- 355

**ප්‍රාදේශීය මහා ලේකම් කාර්යාලය - ඉඹුල්පේ**

උග්ගල් අලුත්නුවර කතරගම දේවාලයේ වාර්ෂික මහ පෙරහැර - 2021

*පෙරහැර පවත්වන කාල සීමාව :*

1. 2021 වසරේ ඇසළ පෙරහැර සඳහා කප්සිටුවීම 2021.08.09 දින සුබ මොහොතින් සිදු කරන ලදී.

 * 2021.09.07 වන දින සර්ව රාත්‍රික පරිත්‍රාණ ධර්ම දේශනාව ද,

 * 2021.09.08 වන දින සිට 2021.09.12 වන දින දක්වා උඩමළුවේ පෙරහැර ද,

 * 2021.09.13 වන දින සිට 2021.09.17 වන දින දක්වා දෙවෙලේ පෙරහැර ද,

 * 2021.09.18 වන දින සිට 2021.09.22 වන දින දක්වා මහා පෙරහැර ද,

 * 2021.09.23 වන දින උදෑසන යෙදෙන සුබ මොහොතින් දිය කැපීමේ මංගල්‍යයෙන් අනතුරුව පෙරහැර ගෙවදීමෙන් ඇසළ පෙරහැර මංගල්‍යය නිමා කිරීමට නියමිතය.

*කඳවුරු ප්‍රදේශය යනු :*

2. දේවාල භූමියේ උඩ වීදිය, නැගෙනහිර පෙදෙස, හා බටහිර පෙදෙස වන පිරිත්වත්ත, ගල්වත්ත, මළුකාරවත්ත සහ උතුරු දෙසින් පිහිටි උඩහගෙදරවත්ත යන සීමාවන්ට මැදිව පිහිටි භූමිභාගය පෙරහැර පවත්වන කඳවුරු ප්‍රදේශය වේ.

*ආහාර හා ජලය :*

3. විහාර මළුව, බෝ මළුව, චෛත්‍යය මළුව, දේවාලය අවට පහත මාලය, කලායතන රථගෙය, මැදවත්ත හා ඒ අවට ප්‍රදේශ තුළ ආහාර පිසීම තහනම් කෙරේ.

4. අලි ඇතුන් ගාල් කර ඇති ස්ථානවල නිකරුණේ ගැවසීම නොකළ යුතු අතර අවසරලත් අය හැර සතුනට ආහාර සැපයීම නොකළ යුතු ය.

5. පෙරහැර පැවැත්වෙන කාල සීමාව තුළ අවශ්‍ය පානීය ජලය හා අමතර ජල ටැංකි යොදා පහසුකම් සැපයීම ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ප්‍රාදේශීය කාර්යාලයට හා ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවට පවරමි.

*වෙළඳාම හා ගොඩනැගිලි ඉදිකිරීම් :*

6. දේවාල උඩ මළුව, මැද වීදිය, මළුවට පිවිසෙන මාර්ගය හා ඒ දෙපස ප්‍රදේශ තුළ මල්, සුවඳ ද්‍රව්‍ය. ඉටි පන්දම් හා භාර සඳහා අවශ්‍ය පූජා භාණ්ඩ විකිණීම සපුරා තහනම් ය.

7. ඉහත අංක 02 වගන්තියෙහි සඳහන් භූමිය තුළ හෝ වෙනත් කිසිම ස්ථානයක වෙළඳාම් කිරීම හා මුදල් උපයන කිසිදු ක්‍රියාවක් නොකළ යුතු ය.

8. පෙරහැර මංගල්‍යය පවත්වන දිනවල, සාමාන්‍යයෙන් පවත්වාගෙන යනු ලබන මවිසින් ලියාපදිංචි කර ඇති ස්ථිර වෙළඳසැල්වල හැර අනෙකුත් වෙළඳාම් කටයුතු සිදු කිරීම තහනම්ය.

9. ප්‍රාදේශීය ලේකම්ගේ බලයලත් නිලධාරියෙකුගේ අනුමැතියක් නොමැතිව කිසියම් තැනැත්තකු විසින් කඳවුරු ප්‍රදේශය තුළ ටිකට්පත්, කොඩි විකිණීම හෝ වෙනත් අන්දමක කුමන කාර්යයක් සඳහා හෝ මුදල් එකතු කිරීම නොකළ යුතු අතර, පෙරහැර පවත්වන කාල සීමාව තුළ එම භූමියේ සහ ඒ අවට දේවාල සීමාව තුළ දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන හා සියලුම මත් ද්‍රව්‍ය විකිණීම හා භාවිතා කිරීම සම්පූර්ණයෙන්ම තහනම් කරමි.

10. මාගෙන් ලබා ගත් අවසරයක් නොමැතිව කඳවුරු ප්‍රදේශයේ කිසිදු ගොඩනැගිල්ලක් ඉදිකිරීම හා අනවසර වෙළඳාම් කටයුතු තහනම් වන අතර, එසේ කටයුතු / ඉදි කිරීම් සෞඛ්‍ය අංශවල නිර්දේශවලට අනුව පොලිසිය විසින් ඉවත් කරනු ලැබේ.

*වාහන :*

11. පෙරහැර පැවැත්වෙන කාලසීමාව තුළ උත්සව භූමියට වාහන ඇතුළු කිරීමට ඉඩ දෙනු ලබන්නේ ඇසළ උත්සවය සඳහා නිකුත් කරනු ලබන බලපත්‍ර ඇති වාහනවලට පමණි. ඒ අනුව පහත සඳහන් මාර්ගවල වාහන ගමනාගමනයට ඉඩ දෙනු නොලැබේ.

 * කොළඹ බදුල්ල ප්‍රධාන මාර්ගයෙන් අලුත්නුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාල මංසන්ධියෙන් දේවාල භූමියට පිවිසෙන මාර්ගය

 * තොටපල්ල, පොකුණේගම ප්‍රදේශයෙන් දේවාල භූමියට පිවිසෙන මාර්ගය.

 * පිරිත්වත්ත, ගල්වත්ත ප්‍රදේශයෙන් දේවාල භූමියට පිවිසෙන මාර්ගය

12. ප්‍රධාන මාර්ගයේ පෞද්ගලික වාහන නතර කිරීම සම්පූර්ණයෙන්ම තහනම් කරමි. බයිසිකල් හා කරත්ත ඇතුළුව සියළුම රථ වාහන මාර්ග හෝ කඳවුරු භාර නිලධාරී තැනගේ බලපතක් නොමැතිව කඳවුර භූමිය තුළට ඇතුළු කිරීම තහනම් ය.

*ඡායාරූප ගැනීම :*

13. දේවාලයේ දික් ගෙය, මාලිගාවේ ඉහළ මාලය, ඡායාරූප ගැනීම හා රූගත කිරීම අනුමැතියකින් තොරව සිදු කිරීම සපුරා තහනම් කෙරේ.

*විදුලිය පහසුකම් :*

14. දේවාල භූමිය හා අවට මාර්ගයේ විදී ලාම්පු හා අමතර ලාම්පු සවි කිරීම ලංකා විදුලිබල මණ්ඩලයට හා ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවට පවරමි.

*සෞඛ්‍ය පහසුකම් :*

15. පෙරහැර මංගල්‍යයට පෙර හා පසු සෞඛ්‍ය කටයුතු, සනීපාරක්ෂක කටයුතු, ඩෙංගු මර්දන කටයුතු හා අපද්‍රව්‍ය ඉවත් කිරීම ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවට, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයට හා සබරගමුව පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයට පවරමි.

16. යම් ආසාදන රෝගයකින් හෝ ස්පර්ශක රෝගයකින් පෙළෙන කිසිම තැනැත්තෙක් කඳවුරු පෙදෙස තුළට ඇතුළත් නොවිය යුතු අතර, රට තුළ බලපවත්වන වර්තමාන සෞඛ්‍ය උපදෙස්වලට, විශේෂයෙන්ම කොවිඩ් - 19 වසංගත තත්ත්වයට අදාළ සෞඛ්‍යාරක්ෂිත මාර්ගෝපදේශවලට අනුකූලව ක්‍රියා කිරීමට තරයේ වග බලාගත යුතු ය.

*යාචකයෝ :*

17. සිඟමන් යැදීම හෝ පිනට ඉල්ලා ගැනීම සඳහා පූජා භූමිය තුළ හෝ කඳවුර පෙදෙස තුළ මුදලින් හෝ යම් වෙනත් ආකාරයකින් හෝ කිසිම තැනැත්තෙකු විසින් පිනට යමක් දීම හෝ පිනට යමක් බෙදා හැරීමට හෝ අවසර නොමැත.

*ආරක්ෂාව :*

18. සියලු ආරක්ෂක කටයුතු, පෙරහැරට අවහිර නොවන ලෙස මාර්ගයේ රථවාහන හැසිරවීම ආරක්ෂක අංශ හා පොලිසිය වෙත පවරමි.

වෙනත් :

19. රතිඤ්ඤා, වෙඩි ආදිය ප්‍රදේශය තුළ පත්තු කිරීම තහනම් ය.

20. මෙවර පෙරහැර මංගල්‍යය චාරිත්‍රානුකූලව පමණක් සිදු කෙරේ.

ඩී. පී. ජී. රේණුකා,
ප්‍රාදේශීය ලේකම්,
ඉඹුල්පෙ.

08- 497

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී - දිගන ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී හි (ලියාපදිංචි අංකය පී. කිව් 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබූ අභියෝජනාව

ණය ගිණුම් අංක : 2400755, 911289 සහ 2145138.

ෂා බැග් ඉන්ඩස්ට්‍රීස්.

2021 අප්‍රේල් මස 28 වැනි දින පවත්වන ලද රැස්වීමකදී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය ඒකච්ඡන්දයෙන් මෙසේ නිශ්චය කරන ලදී.

නුවර ප්‍රසිද්ධ නොතාරිස් කේ. වී. ඒ. ඩී. සී. කේ. විපුලසේන විසින් 2015 ජූලි 17 වැනි දින සහතික කරන ලද උකස් බැදුම්කර අංක 1593, 2016 ජූලි 15 වැනි දින සහතික කරන ලද උකස් බැඳුම්කර අංක 1862 සහ 2017 ඔක්තෝබර් මස 24 වැනි දින සහතික කරන ලද උකස් බැඳුම්කර අංක 2183 දරන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. නමට ලියන ලද්දවූ ද උකස් බැඳුම්කරයන් යටතේ එකී උකස් බැඳුම්කරයන්ට අදාළ උපලේඛනයේ සහ මෙහි පහත පළමු වන උපලේඛනයේ සවිස්තරව විස්තර කරන ලද ඉඩම සහ පරිශ්‍රය සම්බන්ධයෙන් අයවිය යුතු මුදල් ගෙවීම දිගන, නව නගරයේ, අංක 23 දරන ස්ථානයේ ''ෂා බැග් ඉන්ඩස්ට්‍රීස්'' යන නාමය, විලාසය සහ ආයතනය යටතේ තනි අයිතිකරු ලෙස ව්‍යාපාරය පවත්වාගෙන යන සියම්පිල්ලෙයි සන්මුගපිල්ලෙයි ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින්,

සහ නුවර ප්‍රසිද්ධ නොතාරිස් කේ. වී. ඒ. ඩී. සී. කේ. විපුලසේන විසින් 2015 ජූලි 17 වැනි දින සහතික කරන ලද උකස් බැඳුම්කර අංක 1594 දරන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී නමට ලියන ලද්දාවූ උකස් බැඳුම්කරය යටතේ එකී උකස් බැඳුම්කරයට අදාළ උපලේඛනයේ සහ මෙහි පහත දෙවන උපලේඛනයේ සවිස්තරව විස්තර කරන ලද ඉඩම සහ පරිශ්‍රය සම්බන්ධයෙන් අයවිය යුතු මුදල් ගෙවීම දිගන, නව නගරයේ, අංක 23 දරන ස්ථානයේ ''ෂා බැග් ඉන්ඩස්ට්‍රීස් '' හි එකී සියම්පිල්ලෙයි සන්මුගපිල්ලෙයි ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින්,

සහ නුවර ප්‍රසිද්ධ නොතාරිස් කේ. වී. ඒ. ඩී. සී. කේ. විපුලසේන විසින් 2017 ජූලි 14 වැනි දින සහතික කරන ලද

උකස් බැඳුම්කර අංක 2123 දරන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී නමට ලියන ලද්දවූ ද උකස් බැඳුම්කරය යටතේ එකී උකස් බැඳුම්කරයට අදළ උපලේඛනයේ සහ මෙහි පහත තුන්වන උපලේඛනයේ සවිස්තරව විස්තර කරන ලද ඉඩම සහ පරිශ්‍රය සම්බන්ධයෙන් අයවිය යුතු මුදල් ගෙවීම දිගන, නව නගරයේ, අංක 23 දරන ස්ථානයේ ''ෂා බෑග් ඉන්ඩස්ට්‍රීස් '' හි එකී සියම්පිල්ලෙයි සන්මුගපිල්ලෙයි ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින්,

එකී බැඳුම්කරයන් යටතේ වෙනත් කරුණු අතර රුපියල් මිලියන හතලිස් නවයයි හැට හත්දහස් දෙසීය විසි නවයයි ශත පනස් හතර (රු. 49,067,229.54) ක මුළු මුදලක් 2021 මාර්තු මස 26 දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී හට දැන් අයවිය යුතු හා ලැබිය යුතුව ඇති හෙයින් එකී රුපියල් මිලියන හතලිස් නවයයි හැට හත් දහස් දෙසීය විසි නවයයි ශත පනස් හතර (රු. 49,067,229.54) ක මුදල අයකර ගැනීම සඳහා සහ 2021 මාර්තු 27 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට රු. 12,000,000.00ක මුදලක් මත වර්ෂයකට 15.5% බැගින්, රුපියල් 13,725,000.00ක මුදලක් මත වර්ෂයකට AWPLR අගය + 2.50% බැගින් (වර්තමානයේ වර්ෂයකට 8.33% බැගින්) සහ රු. 15,328,000.00ක මුදලක් මත මාස 6 ගණනේ වර්ෂයට AWDR අගය + 4% බැගින් (වර්තමානයේ වර්ෂයකට 12.10% බැගින්) වැඩිදුර පොළිය ද සහිතව ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු ඇතුළුව මෙතෙක් ලබාගෙන ඇත්තාවූ යම් මුදලක් වේ නම් ඒවා ද අඩුකොට, එකී අංක 1593, 1862, 2183, 1594 සහ 2123 දරන උකස් බැඳුම්කරයන් මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී හට උකස්කොට ඇත්තාවූ ද, මෙහි පහත පළමුවන, දෙවන සහ තුන්වන උපලේඛනවල සවිස්තරව විස්තර කොට ඇත්තාවූ ද ඉඩම හා පරිශ්‍රය කොළඹ 12, හල්ෆ්ට්ඩෝප් වීදියේ, 2 වන මහලේ, අංක 200 දරන ස්ථානයේ බලයලත් වෙන්දේසිකරු එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය නිශ්චය කරනු ලබයි.

### පළමු වන උපලේඛනය

1. මධ්‍යම පළාතේ, නුවර දිස්ත්‍රික්කයේ, නුවර මහනගර සභා සීමා ඇතුළත නුවර ගඟවට කෝරළයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 257 නුවර ග්‍රාම නිලධාරී කොට්ඨාසය ඇතුළත කොටුගොඩැල්ල වීදියේ, කළින් කාසල් හිල් ස්ට්‍රීට් වරිපනම් අංක 17 දරන ස්ථානයේ පිහිටි ගොඩනැගිල්ල සමග බලයලත් මිනින්දෝරු බී. පී. රූපසිංහ විසින් 2004 දෙසැම්බර් 05 වැනි දින පිළියෙල කරන ලද අංක 3255 දරන පිඹුරෙන් බෙද වෙන් කරන ලද ලොට් 1 වශයෙන් දක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන් උතුරට : කොටුගොඩැල්ල පටුමගේ වරිපනම් අංක 11 දරන පරිශ්‍රය සහ කොටුගොඩැල්ල වීදියේ, වරිපනම් අංක 19 දරන පරිශ්‍රය මගින් ද, නැගෙනහිරට : කොටුගොඩැල්ල වීදිය මගින් ද, දකුණට : කොටුගොඩැල්ල වීදියේ, වරිපනම් අංක 15 දරන පරිශ්‍රය මගින් ද සහ බස්නාහිරට : එම සැලැස්මේ ලොට් 02 මගින් ද මායිම් වූ පිඹුර ප්‍රකාරව පර්චස් බිංදුවයි දශම නමයයි අටයි හතයි පහ (අ. 0, රූ. 0, පර්. 0.9875) ක විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිල්ල සහ එහි පිහිටි සියළු දේත් සමග වන මෙය නුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්‍ඉරුව A 547/134 යටතේ ලියාපදිංචි කර ඇත.

2. මධ්‍යම පළාතේ, නුවර දිස්ත්‍රික්කයේ, නුවර මහනගර සභා සීමාව ඇතුළත නුවර ගඟවට කෝරළයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 257 නුවර ග්‍රාම නිලධාරී කොට්ඨාසය ඇතුළත කොටුගොඩැල්ල වීදියේ, කළින් කාසල් හිල් ස්ට්‍රීට් වරිපනම් අංක 17 දරන ස්ථානයේ පිහිටි ගොඩනැගිල්ල සමග බලයලත් මිනින්දෝරු බී. පී. රූපසිංහ විසින් 2004 දෙසැම්බර් 05 වන දින පිළියෙල කරන ලද අංක 3255 දරන පිඹුරෙන් බෙද වෙන් කරන ලද ලොට් 2 වශයෙන් දක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන් උතුරට : කොටුගොඩැල්ල පටුමගේ වරිපනම් අංක 11 දරන පරිශ්‍රය මගින් ද, නැගෙනහිරට : එම සැලැස්මේ ලොට් 1 මගින් ද, දකුණට : කොටුගොඩැල්ල වීදියේ, වරිපනම් අංක 15 දරන පරිශ්‍රය මගින් ද, සහ බස්නාහිරට : කොටුගොඩැල්ල පටුමග කලින් කාසල් ඉඩම මගින් ද මායිම් වූ පිඹුර ප්‍රකාරව පර්චස් බිංදුවයි දශම හතයි හතයි පහ (අ. 0, රූ. 0, පර්. 0.7750) ක විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිල්ල සහ එහි පිහිටි සියළු දේත් සමග වන මෙය නුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්‍ඉරුව A 547/132 යටතේ ලියාපදිංචි කර ඇත.

### දෙවන උපලේඛනය

1. මධ්‍යම පළාතේ, නුවර දිස්ත්‍රික්කයේ, පාතදුම්බර පාලිස්පත්තු දුන් මැද දුම්බර පාලිස්පත්තු බටහිර කෝරළෙයේ මැදදුම්බර ප්‍රාදේශීය සභා සීමා ඇතුළත මැදදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නිතුලේමඩ ග්‍රාම නිලධාරී කොට්ඨාසය ඇතුළත පොදවෙල්කෙටිය ගම්මැද්ද හි පිහිටි ''එගොඩහවත්ත '' නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. අබේසුන්දර විසින් 2000 මැයි මස 26 වැනි දින පිළියෙල කරන ලද අංක 1078 දරන පිඹුරෙන් බෙද වෙන් කරන ලද ලොට් 2 වශයෙන් දක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : ප්‍රධාන පාර සිට ගම්මැද්ද සහ නිවාස වෙත පාර මගින් ද, නැගෙනහිරට : එම පිඹුරේ ලොට් 3 මගින් ද, දකුණට : එම පිඹුරේ ලොට් 1 මගින් ද සහ බස්නාහිරට : ප්‍රධාන පාර සිට ගම්මැද්ද සහ නිවාස වෙත පාර මගින් ද මායිම් වූ පිඹුර ප්‍රකාරව පර්චස් අටයි දශම එකයි බිංදුව (අ. 0, රූ. 0, පර්. 8.10) ක විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිල්ල සහ එහි පිහිටි සියළු දේත් සමග වන මෙය නුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්‍ඉරුව S 93/273 යටතේ ලියාපදිංචි කර ඇත.

2. මධ්‍යම පළාතේ, නුවර දිස්ත්‍රික්කයේ, පාතදුම්බර පාලිස්පත්තු දුන් මැද දුම්බර පාලිස්පත්තු බටහිර කෝරළයේ මැද දුම්බර ප්‍රාදේශීය සභා සීමා ඇතුළත මැදදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නිතුලේමඩ ග්‍රාම නිලධාරී කොට්ඨාසය ඇතුළත පොදවෙල්කෙටිය ගම්මැද්ද හි පිහිටි ''එගොඩහවත්ත '' නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. අබේසුන්දර විසින් 2000 මැයි මස 26 වැනි දින පිළියෙල කරන ලද අංක 1078 දරන පිඹුරෙන් බෙද වෙන් කරන ලද ලොට් 3 වශයෙන් දක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : ප්‍රධාන පාර සිට ගම්මැද්ද දක්වා පාර මගින් ද, නැගෙනහිරට : එම පිඹුරේ ලොට් 4 මගින් ද, දකුණට :

එම පිඹුරේ ලොට් 1 මගින් ද සහ බස්නාහිරට : එම පිඹුරේ ලොට් 2 මගින් ද මායිම් වූ පිඹුර ප්‍රකාරව පර්චස් විස්සයි දශම දෙක (අ. 0, රූ. 0, පර්. 20.20) ක විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිල්ල සහ එහි පිහිටි සියළු දේත් සමග වන මෙය නුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්‍රිුරුව S167/145 යටතේ ලියාපදිංචි කර ඇත.

**තුන්වන උපලේඛනය**

මධ්‍යම පළාතේ, නුවර දිස්ත්‍රික්කයේ, මැද දුම්බර පාලිස්පත්තු බටහිර කෝරළයේ මැදදුම්බර ප්‍රාදේශීය සභා සීමා ඇතුළත මැදදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සෙනරත්වෙල ග්‍රාම නිලධාරී කොට්ඨාසය ඇතුළත හෙනගෙහුවෙල මැදගම්මැද්ද පිහිටි ''ගල්ඔරුවේහේන සහ හෙනගෙහුවෙල එස්ටේට්'' නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ටී. බී. එස්. සන්ගරන්දෙනිය විසින් 2017 මැයි 06 වැනි දින පිළියෙල කරන ලද අංක 10306 දරන පිඹුරෙන් බෙද වෙන් කරන ලද ලොට් 1 වශයෙන් දැක්වෙන ත්‍රිකෝණාකාර ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : අංක 2897 දරන පිඹුරේ ලොට් 4 මගින් ද, නැගෙනහිරට සහ ගිණිකොණට : පාර (දිගන පාර සිට සෙනරත්වෙලට මග පෙන්වන) සහ බස්නාහිරට : මහබෙරියතැන්න එස්ටේට් මගින් ද මායිම් වූ පිඹුර ප්‍රකාරව අක්කර දෙකයි පර්චස් විස්ස (අ. 2, රූ. 0, පර්. 20.00) ක විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිල්ල සහ එහි පිහිටි සියළු දේත් සමග වේ.

ඉහත කී ඉඩම පහත දක්වෙන ඒකාබද්ධ කරන ලද ඉඩම් කොටස් වලින් බෙද මායිම් නියම කරන ලද කොටසක් වේ, එනම්,

1. මධ්‍යම පළාතේ, නුවර දිස්ත්‍රික්කයේ, මැද දුම්බර පාලිස්පත්තු බටහිර කෝරළයේ, මැදදුම්බර ප්‍රාදේශීය සභා සීමා ඇතුළත මැදදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සෙනරත්වෙල ග්‍රාම නිලධාරී කොට්ඨාසය ඇතුළත හෙනගෙහුවෙල ගම්මැද්ද පිහිටි ''ගල්ඔරුවේහේන සහ හෙනගෙහුවෙල එස්ටේට් '' නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ටී. බී. අත්තනායක විසින් 1992 ජූලි 04 වැනි දින පිළියෙල කරන ලද අංක 2897 දරන පිඹුරෙන් බෙද වෙන් කරන ලද ලොට් 5 වශයෙන් දක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : ලොට් 4 මගින් ද, නැගෙනහිරට : VC පාර සහ ලොට් 6 මගින් ද, දකුණට සහ නිරිතට : ලොට් 6, ජීව වැට සහ කම්බි වැට මගින් ද මායිම් වූ පිඹුර ප්‍රකාරව අක්කර එකයි රූඩ් දෙක (අ. 1, රූ. 2, පර්. 0) ක විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිල්ල සහ එහි පිහිටි සියලු දේත් සමග වන මෙය නුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්‍රිුරුව S 104/275 යටතේ ලියාපදිංචි කර ඇත.

1. මධ්‍යම පළාතේ, නුවර දිස්ත්‍රික්කයේ, මැද දුම්බර පාලිස්පත්තු බටහිර කෝරළයේ, මැදදුම්බර ප්‍රාදේශීය සභා සීමා ඇතුළත මැදදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සෙනරත්වෙල ග්‍රාම නිලධාරී කොට්ඨාසය ඇතුළත හෙනගෙහුවෙල ගම්මැද්ද පිහිටි ''ගල්ඔරුවේහේන සහ හෙනගෙහුවෙල එස්ටේට් '' නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ටී. බී. අත්තනායක විසින් 1992 ජූලි 04 වැනි දින පිළියෙල කරන ලද අංක 2897 දරන පිඹුරෙන් බෙද වෙන් කරන ලද ලොට් 6 වශයෙන් දක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : ලොට් 5 මගින් ද, නැගෙනහිරට : VC පාර මගින් ද, දකුණට සහ නිරිතට : VC පාර, ජීව වැට සහ කම්බි වැට මගින් ද මායිම් වූ පිඹුර ප්‍රකාරව රූඩ් දෙකයි පර්චස් විස්ස (අ. 0, රූ. 2, පර්. 20.00) ක විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිල්ල සහ එහි පිහිටි සියලු දේත් සමග වන මෙය නුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්‍රිුරුව S 104/283 යටතේ ලියාපදිංචි කර ඇත.

ආර්. ඒ. පී. රාජපක්ෂ,
සමාගම් ලේකම්.

2021 මැයි මස 24 වැනි දින.

08 - 381

---

**කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී - දංකොටුව ශාඛාව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී හි (ලියාපදිංචි අංකය පී. කිව් 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබූ අභියෝජනාව

ණය ගිණුම් අංක : 2363590 සහ 2363597.

පිටියගේ දොන් සන්ජේ දිල්හාන් අප්පුහාමි සහ ජයකොඩි ආරච්චිගේ ආලෝකා සේනානි.

2021 අප්‍රේල් මස 28 වැනි දින පවත්වන ලද රැස්වීමකදී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය ඒකච්ඡන්දයෙන් මෙසේ නිශ්චය කරන ලදී.

වයික්කාල ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්. එන්. අයි. එස්. යූ. ප්‍රනාන්දු විසින් 2013 ජූලි මස 18 වැනි දින සහතික කරන ලද උකස් බැඳුම්කර අංක 9475, 2014 ඔක්තෝබර් 30 වන දින සහතික කරන ලද උකස් බැඳුම්කර අංක 11817, 2017 සැප්තැම්බර් 13 වන දින සහතික කරන ලද උකස් බැඳුම්කර අංක 17263 සහ 2018, පෙබරවාරි මස 26 වන දින සහතික කරන ලද උකස් බැඳුම්කර අංක 17993 දරන එකී බැඳුම්කරයන්ට අදාල උපලේඛනයේ සහ/හෝ මෙහි පහත පළමුවන උපලේඛනයේ සවිස්තරව විස්තර කරන ලද ඉඩම සහ පරිශ්‍රය මත කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී නමට ලියන ලද්දාවූ ද උකස් බැඳුම්කරයන් යටතේ අයවිය යුතු මුදල් ගෙවීම දංකොටුව, බෝලවත්ත පාරේ, අංක 122හි දෙදෙනාම පදිංචි පිටියගේ දොන් සන්ජේ දිල්හාන් අප්පුහාමි සහ ජයකොඩි ආරච්චිගේ අලෝකා සේනානි ණයකරුවන් හැටියට පැහැර හැර ඇති හෙයින්,

සහ මීගමුව ප්‍රසිද්ධ නොතාරිස් පී. ඒ. එම්. ටී. පෙරේරා විසින් 2017 සැප්තැම්බර් මස 13 දින සහතික කරන ලද උකස් බැඳුම්කර අංක 600 දරන එකී උකස් බැඳුම්කරයට අදාළ

උපලේඛනයේ සහ/හෝ මෙහි පහත 2 වන උපලේඛනයේ සවිස්තරව විස්තර කරන ලද ඉඩම සහ පරිශ්‍රය මත කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී නමට ලියන ලද්දාවූ ද උකස් බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම එකී පිටියගේ දොන් සන්ජේ දිල්හාන් අප්පුහාමි සහ ජයකොඩි ආරච්චිගේ ආලෝකා සේනානි ණයකරුවන් හැටියට පැහැර හැර ඇති හෙයින්,

එකී බැඳුම්කරයන් යටතේ ප්‍රතිව්‍යුහගත වාර ණය අංක 2363590 සහ 2363597 හේතුවෙන් රුපියල් මිලියන දහනවයයි හාර ලක්ෂ පනස් දහස් හාරසිය අනූ තුනයි ශත විසි එක (රු. 19,450,493.21) ක මුළු මුදලක් 2021 පෙබරවාරි මස 17 දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් පීඑල්සී හට දැන් අයවිය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින් එකි රුපියල් මිලියන දහනවයයි හාර ලක්ෂ පනස් දහස් හාරසිය අනූ තුනයි ශත විසිඑක (රු. 19,450,493.21) ක මුදල අයකර ගැනීම සඳහා සහ 2021 පෙබරවාරි මස 18 වන දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට රු. 7,325,000.00ක මුදලක් මත වර්ෂයකට 16.00% බැගින් සහ රු. 8,150,000.00ක මුදලක් මත වර්ෂයකට 15.50% බැගින් වැඩිදුර පොළිය ද සහිතව ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු ඇතුළුව මෙතෙක් ලබාගෙන ඇත්තාවූ යම් මුදලක් වේ නම් ඒවා අඩු කොට එකී අංක 9475, 11817, 17263, 17993 සහ 600 දරන උකස් බැඳුම්කරයන් මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී හට උකස්කොට ඇත්තාවූ ද මෙහි පහත පළමුවන සහ දෙවන උපලේඛනවල සවිස්තරව විස්තර කොට ඇත්තාවූ ද ඉඩම සහ පරිශ්‍රය කොළඹ 12, හල්ෆ්ට්ඩෝප් වීදියේ, 2 වන මහලේ, අංක 200 දරන ස්ථානයේ බලයලත් වෙන්දේසිකාර එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය නිශ්චය කරනු ලබයි.

### පළමුවල උපලේඛනය

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, මාරවිල ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය ඇතුළත පිටිගල් කෝරළේ දකුණ ඕතර පළාතේ, ගෝනවිල දකුණ ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ සහ දංකොටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වෙන්නප්පුව ප්‍රාදේශීය සභා සීමා තුළ ගොනවිල ගමේ පිහිටි ''මිල්ලගහවත්ත '' නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ජී. ඒ. එච්. ගුණතිලක විසින් 2013.05.11 වැනි දින පිළියෙල කරන ලද අංක 2653 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 01 වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන් උතුරට : සියදෝරිස් මදුරාවලගේ ඉඩම මගින් ද, නැගෙනහිරට : එබ්බා මගින් ද, දකුණට : ටී. වී. ඇන්තනි පෙරේරාගේ ඉඩම සහ ඒ. කමණි පෙරේරාගේ ඉඩම මගින් ද, සහ බස්නාහිරට : පාර (P.S.) මගින් ද මායිම් වූ පිඹුර ප්‍රකාරව අක්කර එකයි පර්චස් විසි හතරයි දශම පහ (අ. 1, රූ. 0, පර්. 24.5) ක විශාලත්වයෙන් වූ ඉඩම සමග ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියළු දේත් සමග වන මෙය (මාරවිල ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව E220/75 යටතේ ලියාපදිංචි කර ඇත)

### දෙවන උපලේඛනය

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, මාරවිල ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ දංකොටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගොඩැල්ල අංක 473 දරන ග්‍රාම නිලධාරී කොට්ඨාසය ඇතුළත වෙන්නප්පුව ප්‍රාදේශීය සභා සීමා ඇතුළත පිටිගල් කෝරළේ, දකුණ ඕතර පළාතේ, ගොඩැල්ල ගමේ පිහිටි ''දමින්නගහවත්ත හි නොබෙදූ භාග කොටස'' නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු වී. එෆ්. වර්ණකුලසූරිය විසින් 1964.05.28 වන දින පිළියෙල කරන ලද අංක 6715 දරන පිඹුරෙන් බෙද වෙන් කරන ලද ලොට් අංක 2 වශයෙන් දක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : ප්‍රාදේශීය සභා පාර (තඹරවිල සිට දංකොටුව සහ ගොනවිල දක්වා) මගින් ද, නැගෙනහිරට : බලයලත් මිනින්දෝරු වී. එෆ්. වර්ණකුලසූරිය විසින් 1964.05.28 වන දින පිළියෙල කරන ලද අංක 6715 දරන පිඹුරේ ලොට් අංක 1 මගින් ද, දකුණට : බී. එෆ්. මලයප්පා පුල්ලේගේ උරුමකරුවන්ගේ ඉඩම මගින් ද, බස්නාහිරට : ඩී. ජේ. පෙරේරාගේ උරුමකරුවන්ගේ ඉඩම මගින් ද මායිම් වූ පිඹුර ප්‍රකාරව අක්කර එකයි පර්චස් දාහතර (අ. 1, රූ. 0, පර්. 14) විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියළු දේත් සමග වන මෙය මාරවිල ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව E127/145 යටතේ ලියාපදිංචි කර ඇත.

නමුත් ඉහත ඉඩමේ නැවත මැනීමකට අනුව එය පහත පරිදි විස්තර වේ :

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, මාරවිල ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයේ, දංකොටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගොඩැල්ල අංක 473 දරන ග්‍රාම නිලධාරී කොට්ඨාසය ඇතුලත වෙන්නප්පුව ප්‍රාදේශීය සභා සීමා ඇතුළත පිටිගල් කෝරළේ දකුණ ඕතර පළාතේ ගොඩැල්ල ගමේ පිහිටි ''දමින්නගහවත්ත '' නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. ජී. එස්. සමරතුංග විසින් 1990.10.20 වන දින පිළියෙල කරන ලද අංක 3508 දරන පිඹුරෙන් බෙද වෙන් කරන ලද ලොට් අංක 1 වශයෙන් දක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : ප්‍රාදේශීය සභා පාර (තඹරවිල සිට දංකොටුව සහ ගොනවිල දක්වා) මගින් ද, නැගෙනහිරට : බලයලත් මිනින්දෝරු වී. එෆ්. වර්ණකුලසූරිය විසින් 1964.05.28 වන දින පිළියෙල කරන ලද අංක 6715 දරන පිඹුරේ ලොට් අංක 01 මගින් ද, දකුණට : බී. එෆ්. මලයප්පා පුල්ලේගේ උරුමකරුවන්ගේ ඉඩම මගින් ද, බස්නාහිරට : ඩී. ජේ. පෙරේරාගේ උරුමකරුවන්ගේ ඉඩම මගින් ද මායිම් වූ පිඹුර ප්‍රකාරව අක්කර එකයි පර්චස් විසි එක (අ. 1, රූ. 0, පර්. 21) ක විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියළු දේත් සමග වේ.

නමුත් ඉහත ඉඩමේ වඩාත් මෑත නැවත මැනීමකට අනුව එය පහත පරිදි විස්තර වේ :

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, මාරවිල ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයේ, දංකොටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගොඩැල්ල අංක 473 දරන ග්‍රාම නිලධාරී කොට්ඨාසය ඇතුලත වෙන්නප්පුව ප්‍රාදේශීය සභා සීමා ඇතුළත පිටිගල් කෝරළේ දකුණ

ඕතර පළාතේ ගොඩැල්ල ගමේ පිහිටි ''දමින්නගහවත්ත '' නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු යූ. එස්. කේ. එදිරිසිංහ විසින් 2017.05.26 වන දින පිළියෙල කරන ලද අංක 5442 දරන පිඹුරෙන් බෙද වෙන් කරන ලද ලොට් අංක 1 වශයෙන් දක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : ප්‍රාදේශීය සභා පාර (තඹරවිල සිට දංකොටුව සහ ගොනවිල දක්වා) මගින් ද, නැගෙනහිරට : ගොඩැල්ල රෝමානු කතෝලික පල්ලියට අයිති ඉඩම මගින් ද, දකුණට : ගොඩැල්ල රෝමානු කතෝලික පල්ලියට අයිති ඉඩම සහ එෆ්. සී. ප්‍රනාන්දුපුල්ලේ විසින් හිමිකම්ලත් ඉඩම මගින් ද, බස්නාහිරට : ජේ. ඒ. ඩී. පී. ආර්. අප්පුහාමි විසින් හිමිකම්ලත් ඉඩම මගින් ද මායිම් වූ පිඹුර ප්‍රකාරව අක්කර එකයි පර්චස් දහහතයි දශම හත (අ. 1, රූ. 0, පර්. 17.7) ක විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියළු දේත් සමග වේ.

ආර්. ඒ. පී. රාජපක්ෂ,
සමාගම් ලේකම්.

2021 මැයි මස 24 වැනි දින.

08 - 382

---

## කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී හි (ලියාපදිංචි අංකය පී. කිව් 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබූ අභියෝජනාව

ණය ගිනුම් අංකය : 2319677.
මනෝහරන් සතීස්කුමාර්.

2019 ජූලි මස 26 වැනි දින පවත්වන ලද රැස්වීමකදී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විශේෂයෙන් හා ඒකච්ඡන්දයෙන් මෙසේ නිශ්චය කරන ලදී.

මඩකලපුව ප්‍රසිද්ධ නොතාරිස් වී. විනෝබා ඉන්දන් විසින් 2012 මැයි මස 16 වන දින සහතික කරන ලද අංක 16805, 2013 ඔක්තෝබර් 16 වන දින සහතික කරන ලද අංක 17523, 2015 දෙසැම්බර් මස 30 වන දින සහතික කරන ලද අංක 18500 සහ 2016 දෙසැම්බර් මස 7 වන දින සහතික කරන ලද අංක 18797 දරන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී නමට ලියන ලද්දාවූ ද බැඳුම්කරයන් යටතේ අයවිය යුතු මුදල් ගෙවීම මනෝහරන් සතීස්කුමාර් ණයකරු/උකස්කරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරයන් යටතේ රුපියල් මිලියන දොලහයි තුන් ලක්ෂ එකසිය විසි හයයි ශත විසි හය (රු. 12,300,126.26) ක මුදලක් 2019 ජුනි 19 වන දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී හට දැන් අයවිය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින් එකී රුපියල් මිලියන දොලහයි තුන්ලක්ෂ එකසිය විසි හයයි ශත විසිහය (රු. 12,300,126.26) ක මුදල අයකර ගැනීම සඳහා සහ විකිණීමේ දිනය දක්වා කාලයට රු. 11,325,000ක මුදලක් මත 16.00% වැඩිදුර වාර්ෂික පොළිය ද සහිතව ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු ඇතුළුව මෙතෙක් ලබාගෙන ඇත්තාවූ යම් මුදලක් වේ නම් ඒවා ද අඩුකොට එකී අංක 16805, 17523, 18500 සහ 18797 දරන බැඳුම්කරයන් මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී හට උකස්කොට ඇත්තාවූ ද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තාවූ ද දේපල සහ පරිශ්‍රය කොළඹ 12, හල්ෆ්ට්ස්ඩෝප් වීදියේ, 2 වන මහලේ, අංක 200 දරන ස්ථානයේ බලයලත් වෙන්දේසිකාර එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය නිශ්චය කරනු ලැබයි.

### උපලේඛනය

නැගෙනහිර පළාතේ, මඩකලපුව දිස්ත්‍රික්කයේ, මන්මුනෙයි උතුර DS කොට්ඨාසය තුළ කොට්ඨාස අංක SU6 තුළ මඩකලපුව මහනගර සභා සීමා ඇතුළත කොට්ටුකුලම් ග්‍රාම නිලධාරී වසමේ කොතුකුලම් ගමේ, ට්‍රින්කෝ පාරේ, අංක 625/2 දරන ස්ථානයේ ''රින්ග්වුඩ් එස්ටේට් '' නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. සන්ගරලිංගම් විසින් 2007.12.15 දින පිළියෙල කරන ලද අංක MN/130/2007 දරන පිඹුරේ ලොට් අංක 3 ලෙස ලකුණු කරන ලද ඉඩමේ කොටසක් වන බලයලත් මිනින්දෝරු එස්. අන්තෝනිපිල්ලෙයි විසින් 2009.08.30 වන දින පිළියෙල කරන ලද අංක SA/636B/2009/MN දරන පිඹුරේ ලොට් අංක 2 ලෙස ලකුණු කරන ලද බෙද අර්ථ දක්වන ලද කොටසක් වන සහ බලයලත් මිනින්දෝරු ඒ. ඊ. කේ. තිස්ස වීරසිංහ විසින් 2011.12.02 වැනි දින මනින ලද අංක 1625/2011 දරන පිඹුරේ ලොට් අංක 1 ලෙස නැවත මැන විස්තර කොට දක්වන ලද එයට මායිම් වශයෙන්, උතුරට : එම් සතීස්කුමාර් සහ බිරිඳ සුගන්තිට අයිති වූ ඉඩම මගින් ද, නැගෙනහිරට : ඉඩම් ගොඩකිරීමේ කොමිසමට අයිති වූ රින්ග්වුඩ් එස්ටේට් ඉඩම මගින් ද, දකුණට : අංක SA/636B/2009/MN දරන පිඹුරේ ලොට් අංක 3 මගින් ද සහ බස්නාහිරට : ට්‍රින්කෝ පාරට මඟ පෙන්වන මීටර් 6 පළල මාර්ගය මගින් ද මායිම් වූ පිඹුර ප්‍රකාරව පර්චස් තිහ (අ. 0, රූ. 0, පර්. 30) ක විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියළු දේත් සමග වන මෙය මඩකලපුව ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ වෙළුම/පත්ඉරුව E0013/08 යටතේ ලියාපදිංචි කර ඇත.

ආර්. ඒ. පී. රාජපක්ෂ,
සමාගම් ලේකම්.

2019 අගෝස්තු මස 5 වැනි දින.

08 - 383

### කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී හි (ලියාපදිංචි අංකය පී. කිව් 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබූ අභියෝජනාව

ජංගම ගිනුම් අංකය : 1951351501
ණය ගිණුම් අංක : 1917693, 2062399, 2114192 සහ 2161982
ඉකෝ ටෙක් ක්‍රියේට් 21 කම්පැනි (ප්‍රයිවට්) ලිමටඩ්.

2019 සැප්තැම්බර් 27 වන දින පවත්වන ලද රැස්වීමකදී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විශේෂයෙන් හා ඒකච්ඡන්දයෙන් මෙසේ නිශ්චය කරන ලදී.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ජේ. එම්. පී. එස්. ජයවීර විසින් 2015 ජූලි 21 වැනි දින සහතික කරන ලද අංක 2785 සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්. එල්. ජයවීර විසින් 2017 අප්‍රේල් 6 වන දින සහතික කරන ලද අංක 4836 දරන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී නමට ලියන ලද්දවූ ද බැඳුම්කරයන් යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ශ්‍රී ලංකාවේ නීති යටතේ නිසි පරිදි සංස්ථාපිත සමාගමක් වන කටුනායක, ආඬිඅම්බලම, කිඹුලාපිටිය පාරේ, අංක 249 දරන ස්ථානයේ ලියාපදිංචි කාර්යාලය පිහිටා ඇති ඉකෝ ටෙක් ක්‍රියේට් 21 කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ් ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් (මෙහි 1 වන උපලේඛනයේ සවිස්තරව විස්තර කරන ලද ඉඩම)

2015 අගෝස්තු 18 වන දින අංක FCC/2015/77 දරන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී නමට ලියන ලද්දවූ ද බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ශ්‍රී ලංකාවේ නීති යටතේ නිසි පරිදි සංස්ථාපිත සමාගමක් වන කටුනායක, ආඬිඅම්බලම, කිඹුලාපිටිය පාරේ, අංක 249 දරන ස්ථානයේ ලියාපදිංචි කාර්යාලය පිහිටා ඇති ඉකෝ ටෙක් ක්‍රියේට් 21 කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ් ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් (මෙහි 2 වන උපලේඛනයේ සවිස්තරව විස්තර කරන ලද යන්ත්‍රෝපකරණ)

එකී බැඳුම්කරයන් යටතේ ඇමෙරිකානු ඩොලර්ස් මිලියන එකයි හත්ලක්ෂ හතලිස් තුන් දහස් අටසිය අසූ හතරයි ශත විස්ස (ඇ. ඩො. 1,743,884.20)ක (හෝ ඊට සමාන ශ්‍රී ලංකා රුපියල්වලින්) මුදලක් 2019.07.04 වන දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී හට දැන් අයවිය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින් එකී ඇමෙරිකානු ඩොලර්ස් මිලියන එකයි හත් ලක්ෂ හතලිස් තුන්දහස් අටසිය අසූ හතරයි ශත විස්ස (ඇ. ඩො. 1,743,884.20)ක (හෝ ඊට සමාන ශ්‍රී ලංකා රුපියල් වලින්) මුදල අයකර ගැනීම සඳහා සහ 2019 ජූලි 5 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට ඇ. ඩො. 111,717.32 ක (හෝ ඊට සමාන ශ්‍රී ලංකා රුපියල්වලින්) මුදලක් මත 9.898% බැගින් ඇ. ඩො. 814,250/- ක මුදලක් මත වර්ෂයකට LIBOR අගය + 5.5% බැගින් වර්තමාන අනුපාතය වර්ෂයකට 7.898% බැගින් ඇ. ඩො. 329,248.18ක මුදලක් මත වර්ෂයකට LIBOR අගය + 5.5% බැගින් වර්තමාන අනුපාතය වර්ෂයකට 7.898% බැගින් සහ ඇ. ඩො. 186,660/- ක මුදලක් මත මාස 6 ගණනේ වර්ෂයකට LIBOR අගය + 5.5% බැගින් වර්තමාන අනුපාතය වර්ෂයකට 7.7005% බැගින් සහ ඇ. ඩො. 150,000/- ක මුදලක් මත මාස 1 ගණනේ වර්ෂයකට LIBOR අගය + 6% බැගින් වර්තමාන අනුපාතය වර්ෂයකට 8.398% බැගින් වැඩිදුර පොළිය ද සහිතව ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු ඇතුළුව මෙතෙක් ලබාගෙන ඇත්තාවූ යම් මුදලක් වේ නම් ඒවා ද අඩු කොට එකී අංක 2785, 4836, සහ අංක FCC/ 2015/77 දරන බැඳුම්කරයන් මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී හට උකස්කොට ඇත්තාවූ ද මෙහි පහත උපලේඛන හි සවිස්තරව විස්තර කොට ඇත්තාවූ ද දේපළ සහ පරිශ්‍රය, චංචල ව්‍යාපෘති වත්කම් සහ සම්බන්ධිත උපකරණ කොළඹ 12, හල්ෆ්ට්ඩෝප් වීදියේ, 2 වන මහලේ, අංක 200 දරන ස්ථානයේ ත්‍රිවංක සහ සේනානායක හි බලයලත් වෙන්දේසිකරු එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය නිශ්චය කරනු ලබයි.

#### 1 වන උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළේ, දසියා පත්තුවේ, මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ මිනුවන්ගොඩ ප්‍රාදේශීය සභා සීමා ඇතුළත මිනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 123/4, යටියන මධ්‍යම ග්‍රාම නිලධාරී කොට්ඨාසය ඇතුළත යටියන ගමේ පිහිටි රුක්අත්තනගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු පී. ඩී. එන්. පීරිස් විසින් 2010 මාර්තු 22 වැනි දින පිළියෙල කරන ලද අංක 4149 දරන පිඹුරෙන් බෙද වෙන් කරන ලද ලොට් 1 වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට (බලයලත් මිනින්දෝරු ඉන්ද්‍රතිස්ස කොටඹගේ විසින් 2006 පෙබරවාරි 02 වන දින පිළියෙල කරන ලද අංක 24/2006 දරන පිඹුරේ ලොට් 1 සහ බලයලත් ඩබ්. ඒ. ප්‍රනාන්දු විසින් 1976 මාර්තු 03 වන දින පිළියෙල කරන ලද අංක 2038 දරන පිඹුරේ දැක්වෙන ඉඩමේ ඉතුරු කොටස හි ඒකාබද්ධ කිරීමෙක් වන) මායිම් වශයෙන්, උතුරට : පාර (RDA) මගින් ද, නැගෙනහිරට : ඩී. එල්. අබේසේකර විසින් හිමිකම්ලත් ඉඩම මගින් ද, දකුණට : ඩී. එල්. අබේසේකර සහ අනිත් අය විසින් හිමිකම්ලත් කුඹුර මගින් ද සහ බස්නාහිරට : සම්පත් සහ අනිත් අයගේ ඉඩම සහ පාර (පුද්ගලික) මගින් ද මායිම් වූ එකී අංක 4149 දරන පිඹුර ප්‍රකාරව අක්කර දෙකයි පර්චස් තිස් පහ (අ. 2, රූ. 0, පර්. 35) ක විශාලත්වයෙන් යුතු ඉඩම සමග ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියළු දේත් සමග වන මෙය මීගමුව ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ වෙළුම/පත්ඉරුව C988/86 යටතේ ලියාපදිංචි කර ඇත.

#### 2 වන උපලේඛනය

ශ්‍රී ලංකා ජනරජයේ, බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, යටියන, මිනුවන්ගොඩ පාරේ, අංක 298 දරන ස්ථානයේ සමාගම් කර්මාන්තශාලා පරිශ්‍රය තුළට ගෙන එනු ලැබිය හැකි, ණයකරුට අයිති පහත සඳහන් කරන ලද යන්ත්‍රෝපකරණ සහ/හෝ ණයකරුට

දූනට ඇති හෝ මින්මතු ඕනෑම අවස්ථාවක සහ කලින් කලට ව්‍යාපාර කරගෙන යා හැකි අනෙකුත් පරිශ්‍රයන් හි ඇති සහ තබා ඇති හෝ පහත දක්වෙන යන්ත්‍රෝපකරණ සවිකොට තබා ගත හැකි සහ එසේම මින්මතු ඕනෑම අවස්ථාවක සහ කලින් කලට මෙය තවදුරටත් පවත්වාගෙන යාම තුළදී ඉහත කී පරිශ්‍රයේ ගුදම් හෝ ගබඩා මත ගෙනවිත් සවිකර තබා ඇති පහත දක්වෙන යන්ත්‍රෝපකරණ සියල්ල සහ ඒ ව්‍යාපාරය හෝ වෙළදම හෝ එකී මින්මතු සඳහන් කළ යන්ත්‍රෝපකරණ සවි කිරීම මත ණයකරු ඕනෑම අවස්ථාවක ව්‍යාපාරයේ අනෙකුත් ස්ථානය හෝ ස්ථානයන් ට ඉවත් කර හෝ ගෙන හා හැකි සියල්ල වේ

| ප්‍රමාණය | විස්තරය | අනුක්‍රමික අංකය |
|---|---|---|
| 01 | ස්ප්‍රේ ඩ්‍රයර් | CNK-SDD-0350 |

ආර්. ඒ. පී. රාජපක්ෂ,
සමාගම් ලේකම්.

2019 ඔක්තෝබර් මස 22 වැනි දින.

08 - 384

---

## මහජන බැංකුව - කිරිබත්ගොඩ ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ මහජන බැංකුවෙ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 23.12.2020 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් ඩී. එස්. ලෝරන්ස් විසින් 2019.03.30 වන දින සහතික කරන ලද අංක 12973, 2017.06.21 දින සහතික කරන ලද අංක 11119 සහ 2017.12.29 දින සහතික කරන ලද 11902 දරන උකස්කර ප්‍රකාර ගෙවීම්

2007 අංක 07 දරන සමාගම් පනත අනුව අංක PV75587 යටතේ ලියාපදිංචි වී ඇති සනීකා ට්‍රේඩිං කම්පනි (පුද්.) සමාගම යන අය විසින් බන්ධනදායි වශයෙන් ද, හපුආරච්චිගේ චතුරංගි සනීකා විජේසිංහ යන අය විසින් උකස්කරු වශයෙන් ද ගෙවීම පැහැර හැර ඇති බැවින් ද, අංක 12973 දරන උකස්කරය යටතේ රුපියල් විසි දෙලක්ෂ හතලිස් නව දහස් හයසියයි ශත හැට එකක (රු. 2,249,600.61) ක මුදලක් සහ අංක 11119 දරන උකස්කරය යටතේ රුපියල් විසිහතර ලක්ෂ හතලිස් දෙදහසක (රු. 2,442,000.00) ක මුදලක් රුපියල් පහළොස් ලක්ෂ පනස් අට දහසක (රු. 1,558,000.00) මුදලක්, රුපියල් ලක්ෂ විසි තුනක (රු. 2,300,000.00) මුදලක් සහ අංක 11902 දරන උකස්කරය යටතේ රුපියල් ලක්ෂ පහළොවක (රු. 1,500,000.00) මුදලක් මහජන බැංකුවට දනට අයවීමට ඇති බැවින් ද, 2020.05.03 දින සිට වර්ෂයකට 20% බැගින් රුපියල් විසි දෙලක්ෂ හතලිස් නව දහස් හයසියයි ශත හැට එකක (රු. 2,249,600.61) මුදලක් ද, 2019.10.29 දින සිට වර්ෂයකට 18% බැගින් රුපියල් විසි හතර ලක්ෂ හතලිස් දෙදහසක (රු. 2,442,000.00) මුදලක් ද, 2020.02.03 දින සිට වර්ෂයකට 18% බැගින් රුපියල් පහලොස් ලක්ෂ පනස් අට දහසක (රු. 1,558,000.00) මුදලක් ද, 2020.03.01 දින සිට වර්ෂයකට 18% බැගින් රුපියල් ලක්ෂ විසි තුනක (රු. 2,300,000.00) මුදලක් ද, 2020.03.31 දින සිට වර්ෂයකට 21.5% බැගින් රුපියල් ලක්ෂ පහළොවක (රු. 1,500,000.00) මුදලක් ද සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොළිය හා අදාළ මහජන බැංකු පනතේ 29 වගන්තිය යටතේ අයකරනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුකර එකී රුපියල් විසි දෙලක්ෂ හතලිස් නව දහස් හයසියයි ශත හැට එකක (රු. 2,249,600.61) මුදලක්, රුපියල් විසි හතර ලක්ෂ හතලිස් දෙදහසක (රු. 2,442,000.00) ක මුදලක්, රුපියල් පහළොස් ලක්ෂ පනස් අට දහසක (රු. 1,558,000.00) මුදලක්, රුපියල් ලක්ෂ විසි තුනක (රු. 2,300,000.00) මුදලක් සහ රුපියල් ලක්ෂ පහළොවක (රු. 1,500,000.00) මුදලක් අයකර ගැනීම සඳහා කොළඹ බලයලත් වෙන්දේසිකරු ෂොක්මන් සහ සමරවික්‍රම විසින් එකී අංක 12973, 11119 සහ 11902 දරන උකස්කර යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපළ සහ පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරනු ලැබේ.

### දේපළ පිළිබඳ විස්තරය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, අධිකාරි පත්තුවේ, කැළණිය ප්‍රාදේශීය සභා සීමාව තුළ කැළණිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 267, තලවතුහේන්පිට උතුර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ තලවතුහේන්පිට ග්‍රාමයේ පිහිටි මරඳගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩී. සී. එම්. එස්. විමලරත්න මහතා විසින් 2005.03.04 මැන සාදන ලද පිඹුරු අංක 51/2005 දරන පිඹුරේ ලොට් අංක 1A දරන කොටසට මායිම් උතුරට : ලොට් 1ඊ ද, නැගෙනහිරට : ලොට් 1බී සහ 1සී ද, දකුණට : ලොට් 1ඩී ද, බස්නාහිරට : ලොට් 1එෆ් ද යන මායිම් තුළ පිහිටි පර්චස් දහයක් (අ. 0, රූ. 0, පර්. 10) ක් විශාල ඉඩම සහ එහි පිහිටි වැව්ලි, ගොඩනැගිලි ආදී සියළු දේත් සමගින් වේ.

මෙම ඉඩම කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පත්ඉරු අංක G96/144 යටතේ ලියාපදිංචි කර ඇත.

ඉහත කී පිඹුරේ දක්වා ඇති මාර්ග අයිතිවාසිකම ද සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකාර,
ගම්පහ.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
131, නුවර පාර,
බැලුම්මහර,
මුදුන්ගොඩ.

08 - 458